සනාථ කල යුතුය. (ප්‍රංශ හෝ ජර්මන් භාෂාවන් පිළිබඳ දැනුමක් තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.)

05. *වැටුප් පරිමාණය* :- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2004 අනුව, රු. 214,980 - 2 x 7,740 - 5 x 8,580 - රු. 273 360 ( TB 6 1 )

මෙම තනතුරට පත්වීම ලබා වසර තුනක් (03) ඉක්මවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය. වයස පදනම් කරගෙන කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරනු නොලැබේ.

06. බඳවා ගැනීමේ ක්‍රමය :-

විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයකදී දක්වන කුසලතාවය මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශ මත පුරප්පාඩු පුරවනු ලැබේ.

07 සේවා කොන්දේසි :-

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.
(ii) ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 10-12 දක්වා වූ වගන්ති අදාළ වේ.

08 විභාග ගාස්තු :-

මෙම විභාගය සඳහා ගාස්තුව රු. 300 කි. එහෙත් දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් විසින් විභාග ගාස්තුව වශයෙන් ගෙවිය යුත්තේ රු. 150 කි මේ සඳහා ගාස්තු ළඟම ඇති තැපැල් කාර්යාලයට ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සිය ඉල්ලුම්පත්‍රයට අලවා ඉදිරිපත් කළ යුතුය. විභාග ගාස්තු කුමන කරුණක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

09. විභාගයට ඉල්ලුම් කිරීමේ ක්‍රමය :-

(i) මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත ප්‍රකාර 297mm x 210mm (A4) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තේ පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.

(ii) රාජ්‍ය සේවයේ නියුක්ත නොවන අයදුම්කරුවන් විසින් පෞද්ගලික හැඳිනීම මත, තම චරිතය සහ කාර්යශූරත්වය සම්බන්ධයෙන් සහතික කළ හැකි දෙදෙනෙකු තීරකයන් වශයෙන් නම් කළ යුතුය.

(iii) දැනටමත් තැපැල් දෙපාර්තමේන්තුවේ/රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අත්සන්, අදාළ දෙපාර්තමේන්තු/අංශ ප්‍රධානියා/ඒ වෙනුවෙන් බලයලත් නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන් සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු/පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු/රු.240,360 ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රාජ්‍ය නිලධාරියෙකු යන මොවුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

(iv) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර "විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට 2009.02.13 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "තැපැල් දෙපාර්තමේන්තුවේ මුද්දර කාර්යාංශයේ අධ්‍යක්ෂ තනතුර " යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(v) අයදුම්පත්‍ර හෝ ඒ සම්බන්ධ ලිපි හෝ තැපෑලේදී නැති වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අයදුම්පත් ලද බව දන්වා එවනු නොලැබේ. අයදුම්පතේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

10. විභාගයට ඇතුලත් කර ගැනීම :-

(i) සියළුම තොරතුරු සම්පූර්ණ කරමින් ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර අයදුම්පත්‍ර එවා ඇති සියළුම අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, තනතුර සඳහා සුදුසුකම් සම්පූර්ණ කර තිබීමක් ලෙස පිළිගනු නොලැබේ. විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් අත්සන සහතික කරවා ගත් තම ප්‍රවේශ පත්‍ර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට/අපේක්ෂිකාවකට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(ii) සියළු විභාග අපේක්ෂකයින් විසින් රජයේ විභාග සම්බන්ධයෙන් බලපාන පොදු ව්‍යවස්ථාවන් පිළිපැදීමට බැඳී සිටී. යම්කිසි අපේක්ෂකයෙකුට විභාගයට යටත් පිරිසෙයින් දින හතකට (07) කලින් තම ප්‍රවේශ පත්‍රය නොලැබුනහොත් ඔහු/ඇය විසින් ඒ බව වහාම විභාග කොමසාරිස් ජනරාල්, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට දැන්විය යුතුය. ප්‍රවේශ පත්‍ර නොලැබුණු බව විභාග කොමසාරිස් ජනරාල් වෙත දැනුම් දීමේදී පහත සඳහන් තොරතුරු ද සැපයිය යුතුය.

1. විභාගයේ නම :————.
2. අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :————.
3. සම්පූර්ණ ලිපිනය :————.
4. අයදුම්පත තැපැල් කළ දිනය :————.
5. ලියාපදිංචි කිරීමේ අංකය හා තැපැල් කාර්යාලය :————
——.

(iii) විභාගයට ඇතුළත් කර ගැනීම සුදුසුකම් පිළිගැනීමක් සේ අදහස් නොකළ යුතුය. ස්වකීය අභිමතය පරිදි යම්කිසි අපේක්ෂකයෙකුට තාවකාලිකව විභාගයට පෙනී සිටීම පිණිස අවසර දීමට විභාග කොමසාරිස්ට පිළිවන. එසේ දෙනු ලබන අපේක්ෂකත්වය පසුව ස්ථිර කරනු ලැබේ. නැතහොත් අවලංගු කරනු ලැබේ.

(iv) අපේක්ෂකයාගේ අනන්‍යතාවය :-

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අපේක්ෂයෙකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත ඕනෑම ලේඛනයක් භාරගනු ලැබේ.

1. ජාතික හැඳුනුම්පත
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය

